# මධ්‍යම පරිසර අධිකාරිය
# மத்திய சுற்றாடல் அதிகாரசபை
# Central Environmental Authority

පරිසර පියස, 104, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"பரிசர பியச", 104, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை, இலங்கை.
"Parisara Piyasa", 104, Denzil Kobbekaduwa Mawatha, Battaramulla, Sri Lanka. Web: www.cea.lk


අපේ යොමුව / எமது தொடர்பு / Our Ref. } **CEA/06/EPU/FPR/37/2021**
ඔබේ යොමුව / உமது தொடர்பு / Your Ref. }
දිනය / திகதி / Date } **2021.07.28**

## මාධ්‍ය නිවේදනය

### "ජනාධිපති පරිසර සම්මාන - 2021" සඳහා අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය අගෝස්තු 23 දක්වා දීර්ඝ කරයි

මධ්‍යම පරිසර අධිකාරිය විසින් සංවිධාන කරනු ලබන "ජනාධිපති පරිසර සම්මාන - 2021" සඳහා අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය අගෝස්තු 23 වන දින දක්වා දීර්ඝ කරන ලදී. පවතින කොවිඩ් - 19 වංසගත තත්වය හමුවේ අයදුම්කරුවන්ට සිදුවිය හැකි අපහසුතා වැළැක්වීමේ අරමුණින් සංවිධායකයින් මෙම තීරණය ගෙන ඇත.

පරිසර සංරක්ෂණයට විශිෂ්ට මෙහෙවරක් සිදුකළ කර්මාන්ත, ව්‍යාපාර ආයතන හා පුද්ගලයින් අගයමින් රාජ්‍ය ගෞරවය ලබාදීම; පරිසර හිතකාමී කර්මාන්ත, ව්‍යාපාර හා සේවා සංස්කෘතියක් ගොඩනැංවීම, පරිසර හිතකාමී ක්‍රියාකාරීත්වයන් සඳහා සමාජය දිරිගැන්වීම; සහ තිරසර සංවර්ධනයට ජන සහභාගීත්වයක් එක්කර ගැනීම යන අරමුණු පෙරදැරිව මධ්‍යම පරිසර අධිකාරිය විසින් වාර්ෂිකව මෙවැනි සම්මාන උළෙලක් සංවිධාන කිරීමට කටයුතු කරනු ලබයි.

"ජනාධිපති සම්මාන - 2021" සඳහා ප්‍රධාන වශයෙන් අංශ දෙකක් නියෝජනය කරමින් ඉල්ලුම් කළ හැකි අතර වැඩි විස්තර පහත පරිදි වේ.

**A. කර්මාන්ත, ව්‍යාපාර හා ව්‍යාපෘති අංශය (1-15)**

- ඝන අපද්‍රව්‍ය නැවත ලබාගැනීමේ/ ප්‍රතිචක්‍රීකරණ/ බැහැරකිරීමේ හෝ සැකසීමේ කර්මාන්ත
- රසායනික නිෂ්පාදන කර්මාන්ත
- වාහන සේවා ස්ථාන
- ආහාරපාන නිෂ්පාදන කර්මාන්ත
- හෝටල්
- රෙදිපිළි පිරිසැකසුම් කර්මාන්ත
- ඖෂධ නිෂ්පාදන හා රූපලාවන්‍ය නිෂ්පාදන කර්මාන්ත
- ආරෝග්‍ය ශාලා
- රබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත
- සත්ව ගොවිපළවල්
- නිමි ඇඳුම් නිෂ්පාදන කර්මාන්ත
- තේ කර්මාන්ත ශාලා
- මුද්‍රණ කටයුතු සහිත ඇසුරුම් නිෂ්පාදන කර්මාන්ත
- පළාත් පාලන ආයතනවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති
- පුනර්ජනනීය බලශක්ති උත්පාදන ව්‍යාපෘති (කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘති/ සූර්ය බල ව්‍යාපෘති/ සුළං බල විදුලි උත්පාදන ව්‍යාපෘති)


| Chairman | Tel : 2872361, 2872348 Fax : 2872347 | Director General | Tel : 2872359 Fax : 287260 | General Office | Tel : 2872278, 2873447, 2872419, 2873448, 7877277-280 | Complaint : 2888999 |
| --- | --- | --- | --- | --- | --- | --- |
| D. D. G | HRD. Admin. & Finance Tel : 2865296 Fax : 2877515 | Envt. Pollution Control Tel : 2873453 Fax : 2872605 | Envt. Mgt. & Assess. Tel : 2872388 Fax : 2872296 | Envt. Edu. & Awareness Tel : 2872297 Fax : 2872609 | Waste Mgt. Te. 2872409 Fax : 2882152 | Regional Oper. Tel : 2872370 |




පරිසර අමාත්‍යාංශය | சுற்றாடல் அமைச்சு | Ministry of Environment

**B. ආයතන, ජනමාධ්‍ය හා සමාජ අංශය (1-7)**

- පරිසර හිතකාමී රාජ්‍ය ආයතන
- පරිසර හිතකාමී පෞද්ගලික ආයතන
- පරිසර සංරක්ෂණය සඳහා විශිෂ්ට දායකත්වය ලබාදී ඇති පුද්ගලයන්
- පරිසර සංරක්ෂණය හා ප්‍රවර්ධන කාර්යයන් හි කටයුතු කරන ජාතික මට්ටමේ රාජ්‍ය නොවන පරිසර සංවිධාන
- පරිසර හිතකාමී නව නිර්මාණ (විශ්වවිද්‍යාල හා තෘතීක අධ්‍යාපන ආයතන අංශය/විවෘත අංශය)

**ජනමාධ්‍ය අංශය**

- ගවේෂණාත්මක පාරිසරික වාර්තාකරණය
  මුද්‍රිත මාධ්‍ය (සිංහල, දෙමළ, ඉංග්‍රීසි)
- ගවේෂණාත්මක පාරිසරික වැඩසටහන් නිෂ්පාදනය
  ගුවන්විදුලි මාධ්‍ය (සිංහල, දෙමළ, ඉංග්‍රීසි)
- ගවේෂණාත්මක පාරිසරික වැඩසටහන් නිෂ්පාදනය
  රූපවාහිනී මාධ්‍ය (සිංහල, දෙමළ, ඉංග්‍රීසි)

අයදුම්පත් සහ වැඩිවිස්තර මධ්‍යම පරිසර අධිකාරියේ, www.cea.lk යන වෙබ් අඩවියට පිවිසීමෙන් මෙන්ම 0112872278, 0112873447, 0112873448, 0117877277 යන දුරකථන අංක හෝ 1981 ක්ෂණික ඇමතුම් අංකයට ඇමතීමෙන් ලබාගත හැකිය.

2017/ 2018/ 2019 යන වර්ෂවල "ජනාධිපති පරිසර සම්මානලාභීන්" හා "ජාතික හරිත සම්මාන" රන් සම්මානලාභීන්" මෙවර අයදුම් නොකළ යුතු වන අතර එම වසරවල රිදී, ලෝකඩ හා කුසලතා සම්මානලාභීන්ට අයදුම් කළ හැකිය.

අයදුම්පත් 2021 අගෝස්තු මස 23 වන දින හෝ එදිනට පෙර සභාපති, තේරීම් කමිටුව, "ජනාධිපති පරිසර සම්මාන - 2021", මධ්‍යම පරිසර අධිකාරිය, පරිසර පියස, 104, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනැවිත් හෝ භාර දිය හැකිය.

විෂය ප්‍රවීන විද්වත් විනිශ්චය මණ්ඩලයක් මගින් අයදුම්පත් විධිමත් ඇගයීමකට ලක්කර සම්මානලාභීන් තෝරාගනු ලබන අතර විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ. සම්මාන ප්‍රදානෝත්සවය අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට නියමිතය.

මාධ්‍ය සම්බන්ධීකරණය - මාධ්‍ය නිලධාරී - ශ්‍රියාන්ජනී ලොකුලියන - 0776252288

එස්. අමරසිංහ
සභාපති
මධ්‍යම පරිසර අධිකාරිය